**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) - 2021**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 27 දින එළඹි අංක 3483 - එස්ආර්අයි සහ 3484- එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රංශ නියෝජිත ආයතනය අතර 2018 ඔක්තෝබර් 17 දින එළඹි අංක සීඑල්කේ 1022 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 03 ව්‍යවස්ථාවවේ 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය**

---

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ විදුලිබල අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර විදුලිබල මණ්ඩලය වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ ස්ථාවර පද්ධති ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා වැඩිවන බලශක්ති ඉල්ලුම අවශෝෂණය කර ගැනීම සහ ප්‍රතික්‍රියාශීලි බලශක්ති කළමනාකරණයට කොටුමා උපපොළවල් සහ ආශ්‍රිත රැහැන් ඉදිකිරීම් මගින් රටේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,453කට සමාන එජඩො මිලියන 264.7ක් වන අතර ඉන් රු. මිලියන 27,793කට සමාන එජඩො මිලියන 184.7ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ ප්‍රංශ නියෝජිත ආයතනය එකඟවී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2017 ජුලි 10 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව 2022 දෙසැම්බර් 31 දක්වා දිර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,වැඩසටහනේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහනේ වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල<br>රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල විදේශ විනිමය ලාභය හෝ අලාභය වෙනම අනාවරණය කර නොතිබුණි. | 279.8 | කෙරීගෙන යන වැඩ ශේෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ දායකත්වය ලබා ගැනීමේ අරමුණින් විදේශ විනිමය ලාභය/පාඩුව ඉවත්කර ඇත.එම නිසා විදේශ විනිමය ලාභය/පාඩුව වෙනම දැක්වීමේ අරමුණින් හිමිකම් තුළට ඇතුලත් කර නොමැත. | විදේශ විනිමය ලාභය/පාඩුව මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ වෙනම ආවරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියෙහි මෙහෙයුම් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යන විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම මත 2021 දෙසැම්බර් 31 දක්වා ලැබුණු පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල වෙනම දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම පොලී මුදල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනම ඉදිරිපත් කර නොතිබුණු බව අනාවරණය විය. | 8.34 | භාවිත කරන තෙක් විදේශ මුදල් බැංකු ගිණුමක තැම්පත් කරන ලද ප්‍රංශ නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල් ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද ආයෝජනයක් ලෙස සැලකිය නොහැකි අතර එමනිසා ඒ සඳහා උපයන ලද පොලී ආදායම ලංකා විදුලිබල මණ්ඩලයට ආයෝජන මත උපයන ලද ප්‍රතිලාභයක් ලෙස සැලකිය නොහැක. | අදාල ලෙජර ගිණුම්වල එය නිවැරදි කළ යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය විසින් ප්‍රංශ නියෝජිත ආයතනය වෙත පොලිය, බැදීම් ගාස්තු සහ ඇගයීම් ගාස්තු ලෙස ගෙවන ලද මුදල වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 137.49 | එය ව්‍යාපෘතියට අදාළ වුවද නිසි ගනුදෙනු පදනමක් නොමැතිව පිරිවැයක් ලෙස ගිණුම්ගත කිරීමට නොහැක. මේවන තෙක් ඉහත ගාස්තු සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට කිසිදු ඉල්ලීමක් ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශ නියෝජිත ආයතනය යන දෙදෙනා සිදුකර නොමැත. | පොලිය, බැදීම් ගාස්තු සහ ඇගයීම් ගාස්තු වැඩසටහනේ ගිණුම් යටතේ වාර්තා කළ යුතුය. |

## 2.2 නීති රීති සහ රෙගුලාසි සමඟ අනුකූල නොවීම

| | නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් අමාත්‍යාංශය නිකුත් කරන ලද 2016 ජුනි 10 දිනැති අංක 2/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ | වැඩසටහන අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට හෝ වැඩසටහනේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කරවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණන ශාඛාව ව්‍යාපෘතිවල සමස්ථ විගණනයක් සිදු කරනු ලබන අතර එමනිසා වෙනම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | වැඩසටහනේ ගණුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛයේ 9 වගන්තිය | ව්‍යාපෘතිය මෙහෙයුම් කමිටුව ස්ථාපනය කර නොමැත. | ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබයි. තවද, ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබයි. | මෙහෙයුම් කමිටු මඟින් වැඩසටහනේ කටයුතු සමාලෝචනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

## 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ණය ගිවිසුම අනුව වැඩසටහනේ ආරම්භක කටයුතු ප්‍රධාන සංරචක 3ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එනම් සම්ප්‍රේශණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මාධ්‍ය වෝල්ටීය ජාලය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ විදුලිබල කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම් කළමනාකරණය වන අතර කොන්ත්‍රාත් පැකේජ 6ක් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අපේක්ෂිත විය. ඊට අමතරව අනෙකුත් පැකේජ දෙක 2020 වර්ෂයේදී සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සංරචකයට ඇතුළත් කර ඇත. කෙසේවෙතත්, එම කටයුතු 2016 ජූලි 31 සැළසුම් කළ දින සිට වර්ෂ 2ක ප්‍රමාදයක් සහිතව ආරම්භ කර තිබුණු අතර ප්‍රමාදයන් ආවරණය කරගැනීමට කිසිදු පියවරක් ගැනීමකින් තොරව මෙහෙයුම් සිදු කරනු ලැබේ. එමනිසා කොන්ත්‍රාත්වල මිල විචලනයන්, බැදීම් ගාස්තු සහ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම යනාදි අමතර පිරිවැය දැරීමට සිදුවන අවධානම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| **(අ)** | **සම්ප්‍රේශණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම** | | |
| (i) | හම්බන්තොට 220/33 කේවී කොටුමා උපපොළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018දී පිරිනමා ඇති අතර 2018 දෙසැම්බර් 04 දින බලාත්මක වන අතර 2022 පෙබරවාරි 01 දින නිමකිරීමට අපේක්ෂිතය විය. කෙසේවෙතත්, පොල්පිටිය-හම්බන්තොට 220 කේවී නව කොටුමා උපපොළ ඉදිකිරීමේ සහ කිලෝමීටර 150ක් සම්ප්‍රේෂණ රැහැන් එලීමේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ඉදිකිරීමේ කටයුතු 2022 අගෝස්තු 05 විගණිත දිනය වන විටත් නිමකිරීමට නොහැකිවී තිබුණු අතර ව්‍යාපෘති කාලය තුළදී ඉදිකිරීමේ කටයුතු නිම කිරීමේ හැකියාව පිළිබඳව අවිනිශ්චිත වේ. | හම්බන්තොට කොටුමා උපපොළ- ව්‍යාපෘතියේ සියලුම ඉදිකිරීම්, ආරම්භ කිරීම් සහ බලගැන්වීමේ කටයුතු 2022 පෙබරවාරි 01 දින නිමකර ඇත. කෙසේවෙතත්, පොල්පිටිය-හම්බන්තොට 220 කේවී රැහැන් ඉදිකිරීමේ කටයුතු 2022 ඔක්තෝබර් දක්වා සිදුකර ඇත. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ii) | පොල්පිටිය-හම්බන්තොට 220 කේවී නව සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනමා 2018 අගෝස්තු සිට බලාත්මක වූ අතර 2022 මැයි 18 දින නිම කිරීමට අපේක්ෂිත විය. කිලෝමීටර 150ක සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය යටතේ කුළුණු 452න් කුළුණු 399ක් පමණක් අත්තිවාරම් කටයුතු නිමකර තිබුණි. තවද, එසවීමේ කටයුතු ආරම්භ කර කුළුණු 272ක කටයුතු නිමකර තිබුණු අතර කිලෝමීටර 150කින් කිලෝමීටර 50ක රැහැන් ඇදීමේ කටයුතු නිමකර තිබුණි. | ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය 2022 ඔක්තෝබර් 18 දින දක්වා දීර්ඝ කර ඇත. ව්‍යාපෘති ප්‍රගතියට කොවිඩ් 19 සහ ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉන්ධන හිඟකම බලපාන ලදි. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ලැබී තිබුණු තොරතුරු අනුව කිලෝමීටර 24ක පාදුක්ක - හොරණ 132 කේවී සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ සියයට 23 සහ සියයට 38ක අඩු භෞතික සහ මූල්‍ය ප්‍රගතියක් දක්වා තිබුණි. තවද, කිලෝමීටර 24ක් සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය යටතේ 2021 දෙසැම්බර් 31 දිනට කුළුණු 95කින් කුළුණු 4ක පමණක් අත්තිවාරම් කටයුතු නිමකර තිබුණු අතර කිසිදු එසවීම් කටයුත්තක් නිමකර නොතිබුණි. | ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2022 දෙසැම්බර් 16 දක්වා දීර්ඝකර තිබුණි. කුළුණු 90කින් කුළුණු 28ක අත්තිවාරම් කටයුතු නිමකර තිබුණු අතර එසවීමේ කටයුතු 2022 අගෝස්තු 05 දිනට ආරම්භ කර නොතිබුණි. | -එම- |
| (iv) | කොටුගොඩ, කොලොන්නාව, හොරණ, පාදුක්ක, දෙහිවල සහ මාදම්පේ කොටුමා උපපොළවල් වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා 2018 ඔක්තෝබර් 22 දින බලාත්මක වී 2021 සැප්තැම්බර් 30 දින නිම කිරීමට අපේක්ෂිත වුවද, කොන්ත්‍රාත් කටයුතු 2022 අගෝස්තු 03 විගණිත දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. | **උප ලොට් 1**: දෙහිවල සහ මාදම්පේ කොටුමා උපපොළවල් : වැඩිදියුණු කිරීම අවසන් කර ඇත.<br>**උප ලොට් 2**: කොටුගොඩ, කොලොන්නාව, හොරණ සහ පාදුක්ක කොටුමා උපපොළවල් වැඩිදියුණු කිරීම : හොරණ සහ පාදුක්ක නිමකර ඇත.<br>විදුලිබලය ලබා ගැනීමේ ගැටළුව හේතුවෙන් කොටුගොඩ වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රමාදවී ඇත. | -එම- |

**(ආ) මධ්‍ය වෝල්ටීය ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම**

| | | | |
|---|---|---|---|
| (i) | 33 කේවී මධ්‍ය වෝල්ටීය බෙදාහැරීම් මාර්ග සහ කොටුමා උප පොළවල් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනමා 2019 දෙසැම්බර් 03 බලාත්මකවූ අතර කොන්ත්‍රාත්කරු මාස 09ක ප්‍රමාදයක් සහිතව 2020 සැප්තැම්බර් 21 දින කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත් කටයුතු 2021 දෙසැම්බර් 02 දින නිමකිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, කටයුතු 2022 අගෝස්තු 03 විගණිත දින වන විටත් නිමකර නොතිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් ශ්‍රී ලංකා රජය රට වසා දැමීම නිසා ඉදිකිරීම් කටයුතු 2020 මාර්තු 11 සිට බාධාවී තිබුණි. එම කාලය තුළදී සියලුම වැඩබිම් වසා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවී තිබුණි. එමනිසා පළමු කාලය දීර්ඝ කිරීම් 2022 ජුනි 07 දක්වා ලබාදී තිබුණි. තවද, දෙවැනි කාලය දීර්ඝ කිරීම 2022 නොවැම්බර් 07 දක්වා ලබාදී තිබුණි. | -එම- |
| (ii) | රත්තනපිටිය ප්‍රාථමික උපපොළ ඉදිකිරීම සහ බෙලිගහ සහ ඇතුල්කෝට්ටේ ප්‍රාථමික උපපොළවල් වැඩිදියුණු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් ප්‍රදානය කර තිබුණද මාස 07ක ප්‍රමාදයක් සහිතව 2020 ජුලි 08 දින ගිවිසුම අත්සන් කර තිබුණු අතර 2022 සැප්තැම්බර් 20 දින නිමකිරීමට | කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් ප්‍රදානය කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය එම මසම විසුරුවා හරින ලදි. කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන තුරු කල්දමන ලදි. රත්නපිටිය ඉඩමෙහි භෞතික අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබාදී ඇත. | -එම- |

| | | |
|---|---|---|
| අපේක්ෂිත විය. තවද, එම අරමුණු සඳහා රත්නපිටියෙහි තෝරාගත් ඉඩම 2022 අගෝස්තු 05 විගණිත දින වන විටත් අත්පත් කරගෙන නොතිබුණි. මෙම හේතුව නිසා භෞතික ඉදිකිරීම් කටයුතු 2022 අගෝස්තු 05 විගණිත දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | නමුත් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය මේවන විටත් සිදු කරමින් පවතී. | |

(ඇ) **බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම් කළමනාකරණය**

| | | |
|---|---|---|
| වැඩසටහනේ වැඩසටහන් පරිපාලන අත්පොතට අනුව කොන්ත්‍රාත් පැකේජ 6 යටතේ සුහුරු මීටර් ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ 2017 වර්ෂයේ දෙවන කාර්තුවේදී ප්‍රචාරණය කළ යුතුවේ. මෙම පැකේජ යටතේ 2020 වර්ෂයේදී ප්‍රචාරණය කර තිබුණද ලංසු 2021 මාර්තු 22 දින අවසන් කෙරිනි. නමුත් 2022 අගෝස්තු 05 විගණිත දින වන විටත් කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබුණි. | ලංසු කරුගේ ඉල්ලීම මත සංකල්ප ලියවිල්ල නිමකළ යුතු ඉලක්කගත දිනය 2022 සැප්තැම්බර් 23 දක්වා දීර්ඝ කර ඇත. | වැඩසටහනේ අරමුණු ලගාකර ගැනීමට වැඩසටහනේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

### 3.2 ඌනඋපයෝජිත සම්පත්

| **විගණන ගැටලුව** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|
| මුළු ප්‍රතිපාදනය රු.මිලියන 37,880කට සමාන එජඩො මිලියන 260කින් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 20,920කට සමාන එජඩො මිලියන 143ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, වැඩසටහනේ පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 37,880කට සමාන එජඩො මිලියන 259.9ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, එදිනට එම ඉලක්කයෙන් සියයට 55ක් පමණක් අත්කරගෙන තිබුණි. වෙන්කරන ලද අරමුදල්වල මන්දගාමී උපයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිත ආයතනය විසින් රු.මිලියන 549.6ක බැඳීම් ගාස්තු අයකරගෙන තිබුණි. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ආසියානු සංවර්ධන බැංකු ණය ගිවිසුම 2017 ජනවාරි බලපැවැත්වූ නමුත් එය 2017 ජුලි සිට බලපැවැත්වුණි. ප්‍රංශ නියෝජිත ආයතනය ණය ගිවිසුම 2019 මැයි බලපැවැත්වෙන ලදි. පාරිසරික නිෂ්කාශණය සමහරවිට ප්‍රමාදයන්ට හේතුවේ. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |

## 3.3 පරිබාහිර කටයුතු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ණය මුදලින් වැඩසටහන 2016 – 2020 කාලපරිච්ඡේදය තුළදී රු.මිලියන 218.97ක පිරිවැයකට මිලදීගත් මෝටර් වාහන 35හි අයිතිය කොන්ත්‍රාත්කරුගේ නමට පැවතීම නිසා මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට ගෙන නොතිබුණි. මෙය පෙර වර්ෂයේ විගණන වාර්තාවේ සදහන් කළද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මෝටර් වාහනවල අයිතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වෙත මාරු කිරීමට පියවර ගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධව දත්ත සමුදායක් පවත්වා ගැනීමටද පියවර ගෙන නොතිබුණි. තවද, මෝටර් වාහන 35හි ක්ෂය 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | මෝටර් වාහන 35 සඳහා කරන ලද ගෙවීම් 2021 මාර්තු 31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙන තිබුණි. (කෙරීගෙන යන වැඩ යටතට) ව්‍යාපෘතිය අවසන්වූ පසුව අදාළ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මෝටර් වාහනවල අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය නමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ලංකා විදුලිබල මණ්ඩලයට ඇතිවන අවධානය අඩුකර ගැනීමට කොන්ත්‍රාත් ලියවිලිවල වගන්ති වෙනස් කළ යුතුය. |